# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
### (බාහිර) - 2008

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල - SINH - E1015

### නාට්‍ය කලාව, නූතන සිංහල කාව්‍යය සහ ප්‍රබන්ධ කථා

**පළමුවන ප්‍රශ්නය ද, දෙවන සහ තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව - 08යි.**

**කාලය - පැය 03යි.**

**නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

## 1 කොටස

1. පහත සඳහන් පද්‍ය පන්තිය විවේචනය කරන්න.

මුව ජාතියේවද පළමුව උප ත්තේ
එම ජාතියේ සිට නෑරම මම එ ත්තේ
කොයි ජාතියේ උපනත් මෙහෙසුන් ව ත්තේ
මේ ජාතියේ ඇයි මා තනිකර ය ත්තේ

එදා ගියේ තපසට දෙන්න සහ කැලේ
වඩා දෙදරුවන් උකුලට රැගෙන ලොලේ
බෙදා උනිමි පන්සල් දෙකම එක කැලේ
මෙදා මොකද තනිකර යන්ට මම කලේ

තෙමා වැටේ මගෙ සළුපිළි නෙත් පුර වා
අමා රසක් වන් හිමි සඳ සිහිවෙන වා
දමා කුමරු වැඩියා මට සිහිවෙන වා
මෙමා ඇර ලියෝ ලෙව් තුළ ඇද්ද ක වා

උන්නෙමු අපි ඉපිද ලේනුන් කුලේ එ දා
වැටුනේ ජලය මැද සමුදුරයේ බිළි දා
දුනුනේ කපු වීරිය ගොඩ ගන්ට එ දා
හිමි රජුනේ මග ඇරියේ මන්ද මෙ දා

රුවැති පුතුන් මම වැදුවා වැරදී ද
රුව ගුණ තේජසක් මගෙ අඩු වුනාව ද
ගරු සරු නැතිකමක් මාතින් යෙදුනා ද
මරු බිඳ බුදුවෙන්ට සීනෙත් පෙනුනා ද

කැලේ කියන කොයි දේවත් රස    වේවා
මලේ බමරු ලෙස පිරිවර වැඩි    වේවා
අව්වේ තියන රශ්මාලා අඩු    වේවා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑ    දේවා

## 2 කොටස

2. පහත සඳහන් කවීන් අතරෙන් එක් අයෙකුගේ පද්‍ය නිර්මාණ පිළිබඳ ඇගයීමක් කරන්න.

   මොනිකා රුවන්පතිරණ
   ගුණදාස අමරසේකර
   මහගම සේකර
   පරාක්‍රම කොඩිතුවක්කු

3. නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ වන විවිධ මත සමාලෝචනය කරන්න.

නැතහොත්

'නාට්‍යය වනාහි නළු කාර්යයකි' විමසන්න.

4. 'රත්නාවලී නාටකයේ භාවිත නාට්‍යෝචිත අවස්ථා නාට්‍ය සන්දර්භය හා මනාව සුසංයෝග වී ඇත' සාකච්ඡා කරන්න.

නැතහොත්

'රත්නාවලී නාටකයෙන් කාලීන ප්‍රභූ සමාජයේ දුර්වලතා මැනවින් නිරූපණය කෙරෙයි' මේ අදහසට ඔබ එකඟ වන්නෙහිද?

## 3 කොටස

5. සිංහල කෙටිකථාව පැරණි සිංහල කථා කලාවේ ක්‍රමික විකාසනයකි' විමසන්න.

නැතහොත්

කාලීන සමාජ යථාර්ථය නිරූපණයෙහි ලා අද්‍යතන කෙටිකථාකරුවා කෙතෙක් දුරට සමත් වී ඇත්දැයි සාකච්ඡා කරන්න.

6. පහත සඳහන් කෙටිකථාවලින් එකක (01) කලාත්මක අගය පිළිබඳ විවරණයක් කරන්න.

   මාවතේ දරුවෝ
   මංගල රෑස්වීම
   අම්මා
   සීතාම්බරපට

7. සිංහල නවකථාවේ වස්තු විෂයයේ ඒකීයත්වය මෙන් ම විවිධතා ද තත් සාහිත්‍යාංගයේ ප්‍රවර්ධනයට හේතු විය' විමසන්න.

8. 'චිරන්තන සාහිත්‍යාගත මූලාශ්‍රයක් වර්තමාන දේශපාලන අරුතක් කුළුගැන්වෙන සේ ප්‍රතිනිර්මාණය කිරීම තෘෂ්ණාභරණ නවකථාවේ සුවිශේෂ ලක්ෂණය වේ' ඔබේ අදහස් දක්වන්න.